1 වැනි සැසිය

**මානව අවශ්‍යතා - මානව හිමිකම් - මානව වගකීම්**

# මානව හිමිකම් ගැලරිය

පෝස්ටර්




THE LOCAL
CHANGEMAKERS
COURSE

# 1 වැනි වගන්තිය

## අපි සියලු දෙනාම නිදහස් ලෙස හා සමානව උපත ලබා ඇති අතර අපට අපගේ ම සිතුවිලි හා අදහස් ඇත. අපි සියලු දෙනාට ම එක හා සමානව සලකනු ලැබිය යුතු ය.

# 2 වැනි වගන්තිය.

අපි ධනවත් වුව ද, දුප්පත් වුව ද, අපි කුමන රටක ජීවත් වුව ද, කුමන ලිංගික කණ්ඩායමකට අයත් වුව ද, අපගේ ශරීර වර්ණය කුමක් වුව ද, අපි කුමන භාෂාවක් කථා කළ ද, අපි සිතන හෝ විශ්වාස කරන දෙය කුමක් වුව ද, මෙම අයිතිවාසිකම් සෑම මිනිසෙකුට ම අයති ය.



# 3 වැනි වගන්තිය.

## අපි සැමට ජීවිත්වීමේ අයිතිය සහ නිදහසේ හා සුරක්ෂිතව ජීවත්වීමට අයිතිය ඇත.

# 4 වැනි වගන්තිය.

## අපව වහලෙකු බවට පත් කිරීමට කිසිවෙකුට අයිතියක් නැති අතර, අපට වෙනත් කිසිවෙකු අපගේ වහලෙකු බවට පත් කරගත නොහැක.



# 5 වැනි වගන්තිය.

## අපට රිදවීමට හෝ වධ හිංසා කිරීමට හෝ අපට කුරිරු ලෙස සැලකීමට කිසිවෙකුට අයිතියක් නැත.

# 6 වැනි වගන්තිය.

## නීතියෙන් අපව පුද්ගලයෙකු ලෙස පිළිගනු ලැබීමට අප සැමට අයිතියක් ඇත.

# 7 වැනි වගන්තිය.

## නීතිය සෑම කෙනෙකුටම එක හා සමාන ය. එය අපි සියලු දෙනාට සාධාරණ ලෙස සැලකිය යුතු අතර, වෙනස් කොට සලකනු ලැබීමෙන් අපව ආරක්ෂා කළ යුතු ය.



# 8 වැනි වගන්තිය.

## නීතිය විසින් අපගේ අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතු අතර, යමෙකු අපගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරන විට නීතිය අපට උපකාර කළ යුතුය.

# 9 වැනි වගන්තිය.

## සාධාරණ හේතුවක් නොමැතිව අපව අත්අඩංගුවට ගැනීමට හෝ සිරගත කිරීමට හෝ අපව අපේ රටෙන් නෙරපා දැමීමට කිසිවෙකුට අයිතියක් නැත.

# 10 වැනි වගන්තිය.

## නීතිය කඩ කළ බවට යමෙකුට චෝදනා කරන්නේ නම්, එම පුද්ගලයාට සාධාරණ හා ප්‍රසිද්ධ නඩු විභාගයක් සඳහා අයිතිය ඇත.

# 11 වැනි වගන්තිය.

යමෙක් යම් දෙයක් කළ බවට ඔප්පු වන තුරු ඔවුන්ට ඒ සඳහා දොස් නොපැවරිය යුතු ය. අපි නරක දෙයක් කළා යැයි මිනිසුන් පවසන්නේ නම්, එය සත්‍ය නොවන බව ඔප්පු කිරීමට අපට අයිතියක් ඇත. අපි නොකළ දෙයක් වෙනුවෙන් හෝ අපි සිදු කළ නීතියට පටහැනි නොවන දෙයක් වෙනුවෙන් හෝ කිසිවෙක් අපට දඬුවම් නොකළ යුතු ය.

# 12 වැනි වගන්තිය.

අපගේ හොඳ නමට හානි කිරීමට
කිසිවෙක් උත්සාහ නොකළ යුතු ය.
ඉතා සාධාරණ හේතුවක් නොමැතිව
අපගේ නිවසට පැමිණීමට, අපගේ ලිපි
විවෘත කර බැලීමට හෝ අපට හෝ
අපෙගේ පවුලට කරදර කිරීමට
කිසිවෙකුට අයිතියක් නැත.



# 13 වැනි වගන්තිය.

## අපගේ රට තුළ අපට අවශ්‍ය තැනකට යාමට සහ අපි කැමති පරිදි විදේශ රටවලට ගමන් කිරීමට අප සැමට අයිතියක් ඇත.



# 14 වැනි වගන්තිය.

## අපේ රටේදී අප වධහිංසාවට ලක්වීමේ අවදානමක් තිබේ නම්, ආරක්ෂාව සඳහා වෙනත් රටකට යාමට අප සැමට අයිතියක් ඇත.

# 15 වැනි වගන්තිය.

## අප සැම යම් රටකට අයත් වීමට, එනම් පුරවැසිභාවයට අප සැමට අයිතියක් ඇත.

# 16 වැනි වගන්තිය.

සෑම වැඩිහිටි අයෙකුට ම විවාහ වීමට හා ඔවුන්ට අවශ්‍ය නම් පවුලක් සාදා ගැනීමට අයිතිය ඇත.

කිසිවෙකුට විවාහවීම සඳහා බල නොකළ යුතු ය. විවාහ වී සිටින විටත්, වෙන් වී සිටින විටත් පිරිමින්ට හා කාන්තාවන්ට එක හා සමාන අයිතිවාසිකම් ඇත.



# 17 වැනි වගන්තිය.

සෑම කෙනෙකුට ම දේවල් අයිති කර ගැනීමට හෝ ඒවා බෙදා ගැනීමට අයිතිය ඇත. කිසිවෙකු සාධාරණ හේතුවක් නොමැතිව අපගේ දේවල් අපෙන් ලබා නොගත යුතු ය.



# 18 වැනි වගන්තිය.

ස්වාධීනව සිතීමට සහ අපගේ හෘදය සාක්ෂියට අනුව කටයුතු කිරීමට, විශ්වාස දැරීමට සහ ආගමක් තිබීමට අප සැමට අයිතියක් ඇත.

තනිවම හෝ වෙනත් පුද්ගලයින් සමග සහ ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව අපගේ විශ්වාස ඇදහීමට අප සැමට අයිතියක් ඇත.

තමන්ට අවශ්‍ය නම් තමන්ගේ විශ්වාස සහ ආගම වෙනස් කිරීමට සෑම කෙනෙකුට ම අයිතියක් ඇත.



# 19 වැනි වගන්තිය.

පොත් පත් හෝ අන්තර්ජාලය වැනි ඕනෑම ක්‍රමයක් හරහා තොරතුරු වෙත ප්‍රවේශ වී යම් යම් දේ පිළිබඳ තීරණ ගැනීමටත්, අපගේ මත සහ අදහස් දැරීමට සහ ප්‍රකාශ කිරීමටත්, කුමන හෝ ස්ථානයක ජීවත් වන්නා වූ අන් පුද්ගලයින් සමග එම මත සහ අදහස් බෙදා ගැනීමටත් අපි සියලු දෙනාට අයිතිය තිබිය යුතු ය.

# 20 වැනි වගන්තිය.

අපගේ මිතුරන් හමුවීමට සහ සාමකාමීව අපගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා එක්ව වැඩ කිරීම ඇතුළුව එකට එක්ව කටයුතු කරන කණ්ඩායම් නිර්මාණය කර ගැනීමට අප සැමට අයිතියක් ඇත.

අපට යම් කණ්ඩායමකට බැඳීමට අවශ්‍ය නොවේ නම් අපව එම කණ්ඩායමට බලහත්කාරයෙන් බඳවා ගැනීම කිසිවෙකුට කළ නොහැකි ය.

# 21 වැනි වගන්තිය.

මැතිවරණ සඳහා ඉදිරිපත් වීමටත්, මහජන සේවයට සම්බන්ධ වීමටත් අප සැමට අයිතිය ඇත. කලින් කලට පවත්වන මැතිවරණ වලදී දේශපාලන නායකයින්ට ඡන්දය ලබා දීමට සෑම වැඩිහිටියකුට ම අයිතිය ඇත. ප්‍රකාශ කරන ඡන්ද සියල්ල එක හා සමාන වන අතර ඒවා රහසිගතව ප්‍රකාශ කළ යුතු වේ.



# 22 වැනි වගන්තිය.

අපි සියලු දෙනාට ම නිවසක් තිබීමට, ජීවත් වීමට ප්‍රමාණවත් මුදලක් ලැබීමට සහ අප අසනීප වුවහොත් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට අයිතිය ඇත. සංගීතය, කලාව, ශිල්ප හා ක්‍රීඩාව තුළින් විනෝද වීමට සහ අපගේ අදහස් හා හැඟීම් ප්‍රකාශ කිරීමට සහ අපගේ කුසලතා යොදා ගැනීමට අප සැමට අවස්ථාව ලබා දිය යුතු ය.

# 23 වැනි වගන්තිය.

## සෑම වැඩිහිටියෙකුට ම රැකියාවක් කිරීමට, තමන්ගේ වැඩ සඳහා සාධාරණ වැටුපක් ලබා ගැනීමට සහ වෘත්තීය සමිතියකට බැඳීමට අයිතියක් ඇත.



# 24 වැනි වගන්තිය.

## අපි සියලු දෙනාට ම රැකියාවෙන් විවේක ගැනීමට සහ නිස්කලංකව සිටීමට අයිතියක් ඇත.

# 25 වැනි වගන්තිය.

ප්‍රමාණවත් ආහාර, ඇඳුම් පැළඳුම්, නිවාස හා සෞඛ්‍ය රැකවරණය සහිත ගෞරවනීය ජීවිතයකට අප සැමට අයිතියක් ඇත. මව්වරුන් සහ ළමයින්, රැකියාවක් නොමැති පුද්ගලයින්, සහ වයස්ගත හා ආබාධ සහිත පුද්ගලයින් යන සියලු දෙනාට උපකාර ලැබීමට අයිතියක් ඇත.

# 26 වැනි වගන්තිය.

අප සැමට අධ්‍යාපනයක් ලැබීමට අයිතිය ඇත. ප්‍රාථමික අධ්‍යාපනය නොමිලයේ ලැබිය යුතුය. අපට වෘත්තියක් ඉගෙන ගැනීමට හෝ අපගේ සියලු කුසලතා ප්‍රයෝජනයට ගැනීමට හැකි විය යුතු ය.

# 27 වැනි වගන්තිය.

## අපගේ සංස්කෘතියට සහ විද්‍යාව හා දැනුම මගින් සමාජයට ගෙනෙන යහපත් දේ භුක්ති විඳීමට අප සැමට ම අයිතියක් ඇත.

# 28 වැනි වගන්තිය.

## අපගේ අයිතිවාසිකම් සහ නිදහස භුක්ති විඳීමට හැකි වන පරිදි විධිමත්, සාමකාමී සමාජයක හා ලෝකයක ජීවත් වීමට අපිට අයිතියක් ඇත.



# 29 වැනි වගන්තිය.

## අපිට අනෙක් පුද්ගලයින් කෙරෙහි යුතුකම් තිබෙන අතර, අපි ඔවුන්ගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කළ යුතු ය.

# 30 වැනි වගන්තිය.

## අනෙකුත් පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සහ නිදහස අහිමි වන ආකාරයට කටයුතු කිරීමට කිසිදු රාජ්‍යයකට හෝ පුද්ගලයෙකුට අවසර නැත.